# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

**අංක 2021/37 - 2017 ජුනි මස 01 වැනි බ්‍රහස්පතින්දා - 2017.06.01**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# III වැනි කොටස - ඉඩම්

## ඉඩම් රජයට ගැනීම පිළිබඳ දැන්වීම්

**ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

7 වැනි වගන්තිය යටතේ දැන්වීම

*යොමු අංකය* : ම/සං/03/229.

මහජන කටයුත්තක් සඳහා අවශ්‍ය පහත දැක්වෙන ඉඩම් ලබා ගැනීමට ආණ්ඩුව අදහස් කරන බැව් ඉඩම් අත්කර ගැනීමේ පනතේ 7 වැනි වගන්තියේ (1) වැනි උපවගන්තිය යටතේ මෙයින් දැනුම් දී සිටිමි.

*ලබා ගැනීමට බලාපොරොත්තු වන ඉඩම්වල විස්තර* :

බස්නාහිර පළාතේ, ගම්පහ දිස්ත්‍රික්කයේ, මහර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, අධිකාරි පත්තුව සුළු කොට්ඨාසයේ, ඉහල කරගහමුණ උතුර (248) ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ ඉහල කරගහමුණ ගමේ පිහිටි සර්වේයර් ජනරාල් විසින් පිළියෙල කරන ලද මූලික පිඹුරු ගම් 3985 සහ 2017.01.30 දිනැති මූලික පිඹුරේ කැබලි අංක 01 සිට 03 දක්වා පෙන්නුම් කර ඇති ප්‍රමාණයෙන් හෙක්. 0.0270 ක් පමණ වූ පහත විස්තර සඳහන් කෙරෙන ඉඩම් කැබලි 03 සඳහා මායිම් :

**1. කැබලි අංක 01**
ඉඩමේ නම: මිල්ලගහවත්ත; විස්තරය : ගෙවත්ත, අවුරුදු 10ක් පමණ වයසැති පොල්ගස් 3ක් ඇත; හිමිකම් කියන අය : රජය; මුල් හිමිකම් කියන අය : පී. වී. ජේ. පෙරේරා, අංක 110, මංගල මාවත, ඉහල කරගහමුණ, කඩවත; ප්‍රමාණය: හෙක්. 0.0081.

**2. කැබලි අංක 02**
ඉඩමේ නම: —; විස්තරය : පාර; හිමිකම් කියන අය : රජය; මුල් හිමිකම් කියන අය : සොයාගත නොහැක; ප්‍රමාණය: හෙක්. 0.0099.

**3. කැබලි අංක 03**
ඉඩමේ නම: මිල්ලගහවත්ත; විස්තරය : ගෙවත්ත, අවුරුදු 10ක් පමණ වයසැති පොල්ගස් 3ක් ද අඹ ගසක්ද ඇත; හිමිකම් කියන අය : රජය; මුල් හිමිකම් කියන අය : පී. වී. එස්. ජේ. පෙරේරා, අංක 106, මංගල මාවත, ඉහල කරගහමුණ, කඩවත; ප්‍රමාණය: හෙක්. 0.0090.

ඉහත සඳහන් ඉඩමට හිමිකම්, අයිතිවාසිකම් හෝ වෙනත් සම්බන්ධකම් කියා සිටින සියලු දෙනාම තම තමන්ගේ හෝ ඔවුන්ගේ ලියවිලිවලින් බලයලත් අයවලුන් හෝ 2017 ජූලි මස 05 වැනි දින පෙ. ව. 09.00ට මහර ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී මා සම්මුඛ විය යුතුයි.

තව ද, 2017 ජුනි මස 28 වැනි දිනට මත්තෙන් ඒ ඉඩම සම්බන්ධයෙන් ඔවුන්ගේ අයිතිවාසිකම්වල ස්වභාවයත් එකී ඉඩම ලබාගැනීම ගැන වන්දි ඉල්ලීමට ඇති කරුණු පිළිබඳ විස්තරත් වන්දි මුදල හා ඒ මුදල ගණන් බැලූ හැටිත් මා වෙත පිටපත් දෙකක් සහිත වූ ලියවිල්ලකින් දැනුම් දිය යුතුයි.

ජී. එස්. අයි. විමලසේන,
ප්‍රාදේශීය ලේකම්,
මහර.

2017 මැයි මස 31 වැනි දින,
මහර ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී ය.

06 - 578